**Astronomical Society of Sabaragamuwa University of Sri Lanka**
Department of Physical Sciences & Technology
Faculty of Applied Sciences
Sabaragamuwa University of Sri Lanka
P.O. Box 02, Belihuloya, Sri Lanka
assusl@sab.ac.lk

**President**
S.A.S.A.A. Gunarathne
071 3810858

**Secretary**
G.P.T. Nethmini
078 7731377

**Treasurer**
M.A.P. Nilminda
076 6382650

**Senior Treasurer**
Dr. L.M.M. De Silva
077 0514262

**Academic Advisors**
Prof. G.M.L.P. Aponsu
Dr. H.N.M. Sarangika
Dr. W.T.L.S. Fernando
Dr. D.R. Welikanna
Ms. J.A.D.M. Dharmathilaka
Mr. P.R.S. Tissera

**External Academic Advisors**
Mr. N.I. Medagangoda

**"ජාතික තාරකා කඳවුර 2026" සඳහා සහභාගී වීමට ආරාධනා කිරීම.**

ගරු මහත්මයාණෙනි / මහත්මියනි,

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ තාරකා විද්‍යා සංගමය , නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT) සමඟ එක්ව, 2026 අගෝස්තු මස 14 වන දින ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ දී ජාතික තාරකා කඳවුර පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

මෙම වැඩසටහන පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් සහ සාමාන්‍ය ජනතාව අතර තාරකා විද්‍යාව, තාරකා භෞතික විද්‍යාව සහ අභ්‍යවකාශ විද්‍යාව පිළිබඳ උනන්දුව හා දැනුම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කර ඇත. මෙම වැඩසටහනට පහත ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

- **වයස අවු. 6 සිට 11 දක්වා**

    - චිත්‍ර තරඟය

විවෘත චිත්‍ර තරඟයක් වයස අවුරුදු 6–11 අතර පාසල් සිසුන් සඳහා පැවැත්වේ. සුදුසුකම් ලබන සිසුන්ට තම චිත්‍රයේ ස්කෑන් කළ ඩිජිටල් පිටපතක් නියමිත ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය ඔස්සේ යොමු කරමින් තරඟයට සහභාගී විය හැකිය.තරඟයේ තේමාව සහ ඉදිරිපත් කිරීමේ මාර්ගෝපදේශ ලියාපදිංචි වීමෙන් පසු දැනුම් දෙනු ලැබේ. සියලුම සහභාගිවන්නන් සඳහා සහභාගීත්ව සහතික ප්‍රදානය කරනු ලැබේ.

ඉදිරිපත් කරන ලද චිත්‍ර විනිශ්චය මණ්ඩලයක් මඟින් ඇගයීමට ලක් කරනු ලබන අතර ජයග්‍රාහකයින්ට සහතිකපත් ප්‍රදානය කරනු ලැබේ. තේරී පත්වන ජයග්‍රාහකයින් ජාතික මට්ටමේ චිත්‍ර තරඟය සඳහා සුදුසුකම් ලබනු ඇත. එම ජාතික මට්ටමේ තරඟයෙන් තේරී පත්වන විශිෂ්ට නිර්මාණ, ආසියා-පැසිෆික් කලාපීය අභ්‍යවකාශ ආයතන සංසදය (APRSAF) සංවිධානය කරන ජාත්‍යන්තර චිත්‍ර තරඟයේ ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

චිත්‍ර නිර්මාණ සඳහා අවශ්‍යතා

- චිත්‍රය සිසුවාගේ/සිසුවියගේ ස්වයං නිර්මාණයක් විය යුතුය.
- චිත්‍රය සමතලා කඩදාසි පත්‍රයක් මත නිම කළ යුතුය.
- කඩදාසියේ ප්‍රමාණය A3 (297 × 420 mm) ට වඩා කුඩා නොවිය යුතු අතර A2 (420 × 594 mm) ට වඩා විශාල නොවිය යුතුය.
- පැන්සල්, පාට ක්‍රේයොන්, ජල වර්ණ සහ තෙල් වර්ණ ඇතුළු සාම්ප්‍රදායික චිත්‍ර කලාව සඳහා භාවිත කරන උපකරණ පමණක් භාවිත කළ යුතුය.
- ඩිජිටල් චිත්‍ර නිර්මාණ මෘදුකාංග හෝ උපකරණ භාවිතයෙන් සකස් කරන ලද නිර්මාණ

ලියාපදිංචිය සඳහා පහත සබැඳිය භාවිතා කරන්න:

https://forms.gle/wiRr7qXxSRCwXtxC6

- **වයස අවුරුදු 12 සහ ඊට වැඩි**

  - සූර්යය නිරීක්ෂණය (දහවල් 12.30 සිට)

තාරකා විද්‍යා උපදේශකවරුන්ගේ මගපෙන්වීම යටතේ සූර්යය දුරේක්ෂ භාවිතයෙන් සුරක්ෂිතව සූර්යයා නිරීක්ෂණය කිරීමට සහභාගීවන්නන්ට අවස්ථාව ලැබේ. මෙම සැසිය මඟින් සූර්යය ලප, සූර්යය ක්‍රියාකාරකම් සහ මූලික සූර්යය විද්‍යාව පිළිබඳ දැනුම ලබා ගත හැක.

  - ගැඹුරු රාත්‍රී අහස නිරීක්ෂණය

රාත්‍රී කාලයේ දුරේක්ෂ භාවිතයෙන් චන්ද්‍රයා, ග්‍රහලෝක, තාරකා, මන්දාකිණි සහ අනෙකුත් ගැඹුරු ආකාශ වස්තු නිරීක්ෂණය කිරීමට මෙම සැසියෙන් අවස්ථාව ලැබේ. තරු රටා සහ රාත්‍රී අහස පිළිබඳ මූලික දැනුමද ලබා දෙනු ලැබේ.

  - ජල රොකට් තරඟය

සහභාගි වන සිසුන් සඳහා වැඩසටහන පවත්වන දිනයේදී ජල රොකට් තරඟයක් පැවැත්වේ. මෙම තරඟයට පෙර, ජල රොකට් සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ දියත් කිරීමේ ක්‍රමවේද පිළිබඳ මාර්ගගත (Online) සම්මන්ත්‍රණයක් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ (ACCIMT) ජ්‍යෙෂ්ඨ උපදේශකවරුන්ගේ මෙහෙයවීමෙන් පැවැත්වේ. මෙම තරඟයේ ජයග්‍රාහකයින් ජාතික මට්ටමේ ජල රොකට් තරඟයකට සහභාගී වීම සඳහා සුදුසුකම් ලබනු ඇත.

  - තාරකා විද්‍යාව ආශ්‍රිත ආකෘති, යෙදුම් හා ව්‍යාපෘති ඉදිරිපත් කිරීම

පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන්ට තාරකා විද්‍යාව ආශ්‍රිත නව්‍ය ව්‍යාපෘති, ජංගම හෝ පරිගණක යෙදුම්, පර්යේෂණ ඉදිරිපත් කිරීම් සහ නිර්මාණාත්මක ආකෘති ඉදිරිපත් කිරීමට ආරාධනා කරනු ලැබේ. සහභාගීවන්නන් තම නිර්මාණ හා ව්‍යාපෘතිවල විද්‍යාත්මක සංකල්ප, ක්‍රියාකාරිත්වය සහ භාවිතයන් විනිශ්චය මණ්ඩලය හා ප්‍රේක්ෂකයින් වෙත පැහැදිලි කළ යුතුය. විශිෂ්ට ඉදිරිපත් කිරීම් හා නවෝත්පාදන ඇගයීමට ලක් කර ත්‍යාග පිරිනමනු ලැබේ.

ලියාපදිංචිය සඳහා පහත සබැඳිය භාවිතා කරන්න:

https://forms.gle/D3PuGHaREJhicfr29

පාසල් නියෝජනය කරමින් කණ්ඩායමක් ලෙස හෝ තනිව සහභාගී වන ශිෂ්‍යයින්, ලියාපදිංචි පෝරමයේ තොරතුරු සපයා ඇති ගුරුවරයෙකු සමඟ සහභාගී විය යුතු අතර වයස අවුරුදු 12–17 අතර තනි සහභාගීවන්නන්, ලියාපදිංචි කිරීමේදී තොරතුරු ලබා දී ඇති දෙමාපියෙකු හෝ භාරකරුවෙකු සමඟ සහභාගී විය යුතුය

සහභාගීවන්නන්ට වටිනා සහතිකපත්‍ර, අත්පත්‍රිකා, ඇඳුම් මාරු කිරීම සඳහා පහසුකම් සහ නොමිලේ සංග්‍රහ ලබා දෙනු ලැබේ. ප්‍රවාහන පහසුකම් සපයනු නොලැබෙන බව කරුණාවෙන් සලකන්න.

ලියාපදිංචි ගාස්තුව එක් සිසුවෙකු සඳහා රුපියල් 500/- කි. පළමු වටයේ ලියාපදිංචිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ගෙවීම් ක්‍රමවේදය පිළිබඳ විස්තර සහභාගිවන්නන් වෙත දැනුම් දෙනු ලැබේ. ලියාපදිංචි පෝරමයට ඉදිරි දැනුම්දීම් හා වැදගත් තොරතුරු ලබාදීම සඳහා ක්‍රියාකාරී WhatsApp අංකයක් සහ email ලිපිනයක් ඇතුළත් කිරීම අනිවාර්යය වේ.

මෙම අවස්ථාව සහභාගීවන්නන්ගේ විද්‍යාත්මක දැනුම වර්ධනය කිරීමටත්, තාරකා විද්‍යාව හා අභ්‍යවකාශ ගවේෂණය පිළිබඳ උනන්දුව වැඩිදියුණු කිරීමටත් උපකාරී වනු ඇතැයි අප විශ්වාස කරමු. ඔබගේ සහයෝගය හා සහභාගීත්වය අප ඉතා අගය කරමු. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර අප හා සම්බන්ධ වන්න.

- Dr. L.M.M. De Silva (077 0514262) - malith@appsc.sab.ac.lk
- Mr. P.R.S. Tissera (075 3746840) - prstissera@appsc.sab.ac.lk
- G.P.T.Nethmini (078 7731377) – tharushikagpnethmini@gmail.com

**අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් වැඩසටහන නියමිත දිනට පැවැත්වීමට නොහැකි වුවහොත්, එය වෙනත් දිනයකට කල් දැමීමට සිදුවන අතර, නැවත පවත්වන දිනය පිළිබඳව සියලුම සහභාගිවන්නන් දැනුවත් කරනු ලැබේ.**

මෙයට විශ්වාසී,



ජී.පී.ටී. නෙත්මිණි
ලේකම්
ASSUSL